පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
| --- |
| 12 |

# තුන්වන වාර පරීක්ෂණය - 2023

විෂයය :- සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - I

පාසලේ නම : ..............................................................................

ඇතුළත්වීම් අංකය : ................................

කාලය : පැය 02 යි

**උපදෙස් :**

- ❖ සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ❖ 1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරු වලින් නිවැරදි හෝ ඉතාමත් නිවැරදි හෝ පිළිතුර තෝරා උත්තර පත්‍රයේ කතිරයකින් (×) සටහන් කරන්න.
- ❖ එක් ප්‍රශ්නයකට ලකුණු 1 බැගින් ලකුණු 50 ක් හිමි වේ.

---

01) සන්නිවේදන අධ්‍යයන ක්ෂේත්‍රය ස්වාධීන විෂයයක් ලෙස වැඩීමටත්, ගැඹුරින් අධ්‍යයනය කිරීමටත් ප්‍රධාන වශයෙන් හේතු වූ කරුණු අතරට අයත් නොවන්නේ,

1) සන්නිවේදන තාක්ෂණයේ දියුණුව  2) ජනමාධ්‍යයන්ගේ වර්ධනය
3) මාධ්‍යයේ සමාජ බලපෑම  4) සාම්ප්‍රදායික මාධ්‍ය පරිහානිය
5) ජනමාධ්‍යයන්ගේ ව්‍යාප්තිය

02) යුද්ධයෙන් පීඩාවට පත්ව සිටි ජනතාවගේ බිඳ වැටුණු මානසිකත්වය ප්‍රතිෂ්ඨාපනය සඳහා යොදා නොගත් මාධ්‍ය විධික්‍රමය වන්නේ,

1) ටෙලි නාට්‍ය  2) චිත්‍රපට  3) වේදිකා නාට්‍ය  4) පුවත්පත්  5) ගීත

03) "ජනතාව හා ඔවුන්ගේ ගැටලු" කෘතිය රචනා කරනු ලැබුවේ,

1) වෝල්ටර් ලිප්මාන් විසිනි  2) ජෝන් ඩූවි විසිනි.
3) විල්බර් ශ්‍රාම් විසිනි.  4) හැරල්ඩ් ලැස්වෙල් විසිනි.
5) චාල්ස් කූලි විසිනි.

04) මානව සම්බන්ධතා පවත්වා ගැනීමේ හා වර්ධනය කිරීමේ යාන්ත්‍රණය සන්නිවේදනය බව විග්‍රහ කරන ලද්දේ,

1) විල්බර් ශ්‍රාම් ය.  2) ජෝන් ඩූවී ය.  3) සැමුවෙල් පුෆෙන්ඩෝර්ෆ් ය.
4) චාල්ස් කූලිය  5) ඊ.බී. ටයිලර් ය.

05) 1940 දශකයේ දී සන්නිවේදන අධ්‍යයනය ශාස්ත්‍රීය විෂය ක්ෂේත්‍රයක් ලෙස ආයතනගත කිරීමට පියවර ගන්නා ලද්දේ,

1) හැරල්ඩ් ඩී. ලැස්වෙල් විසිනි.  2) විල්බර් ශ්‍රාම් විසිනි.  3) කර්ට් ලෙවින් විසිනි
4) වොරන් වීවර් විසිනි.  5) චාල්ස් කූලි විසිනි.

06) වර්තමානය වන විට සන්නිවේදන අධ්‍යයන ක්ෂේත්‍රයේ විෂය පථය තවදුරටත් පුළුල් කිරීමට හේතු වී ඇත්තේ,

1) රූපවාහිනියේ ක්‍රියාකාරිත්වයයි.  2) දුරකථනයේ ක්‍රියාකාරිත්වයයි.
3) නව මාධ්‍යයේ ක්‍රියාකාරීත්වයයි.  4) සමාජ මාධ්‍යයේ ක්‍රියාකාරීත්වයයි.
5) නව මාධ්‍ය හා සමාජ මාධ්‍ය ක්‍රියාකාරීත්වයයි.

07) A. කාර්මික විප්ලවය
B. පළමුවන ලෝක යුද්ධය
C. දෙවන ලෝක යුද්ධය
D. ආගමික ප්‍රතිසංස්කරණ
E. දේශපාලන ප්‍රතිසංස්කරණ

මේවා අතරින් සන්නිවේදන තාක්‍ෂණයේ සිදු වූ ශීඝ්‍ර දියුණුවට හේතු වූයේ,

1) A, B හා D ය.
2) B, C, D, E ය.
3) A, B හා C පමණි.
4) A, D, E පමණි.
5) A, B, C, D, E යන සියල්ලම ය.

08) සංඥා, සංකේත, ශබ්ද මගින් අදහස් හුවමාරු කරගත් මානවයාට වඩාත් පුළුල් ලෙස අදහස් හුවමාරු කර ගැනීමට හැකියාව ලැබුනේ,

1) දුරකථනය නිසාවෙනි. 2) අක්ෂර මාලාව හොයාගත් නිසාවෙනි. 3) භාෂාව බිහිවීම නිසාවෙනි.
4) සන්නිවේදන විෂය නිසාවෙනි. 5) නොදියුණු කටහඬ නිසාවෙනි.

09) පාසල් නිමා වී ගෙදර එමින් සිටි සයුරි අතරමග දුටු ගැහැනුන් දෙදෙනෙකුගේ රණ්ඩු සරුවල්වීමේ සිද්ධිය පිළිබඳව තම මවට නිවසට ගොස් ප්‍රකාශ කළාය. මෙම සිද්ධිය මැනවින් ගම්‍යමාන වන නිර්වචනය වන්නේ,

1) ලැස්වෙල් නිර්වචනය 2) බර්ලෝ නිර්වචනය 3) ශ්‍රාම් නිර්වචනය
4) ෂැනොන් - වීවර් නිර්වචනය 5) ෂැපීර් නිර්වචනය

10) සන්නිවේදනය හඳුනාගැනීම සම්බන්ධයෙන් වන ප්‍රකාශ කිහිපයක් පහත පරිදි වේ.

A) තොරතුරු හුවමාරුව සන්නිවේදනය යි.
B) මානව සන්නිවේදනය මානව සමාජ සම්භවයට පසුව පැමිණියකි.
C) එය දෛනික ජීවිතය හා සම්බන්ධ වූවකි.
D) තොරතුරු හුවමාරුව කඩිනම් වීමට සන්නිවේදන තාක්ෂණය එතරම් බලපෑමක් නැත.
E) භාෂාව සම්භවයත් සමගම තොරතුරු ගබඩාකර තබාගැනීමට පහසු විය.

ඉහත ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශ අන්තර්ගත පිළිතුර වනුයේ,

1) A හා B ය. 2) A හා C ය. 3) B හා C ය. 4) C හා D ය. 5) D හා E ය.

11) නාලිය නොහොත් මාධ්‍යය පිළිබඳව සාවද්‍ය ප්‍රකාශය වන්නේ,

1) සන්නිවේදක ස්ථානයේ සිට ග්‍රාහක ස්ථානයට සන්දේශයක් රැගෙන යන්නකි.
2) පණිවිඩ රැගෙන යාම සඳහා මෙය වැදගත් වේ.
3) මානවයින් භාවිතා කරනු ලබන නාලිකා වන්නේ ජනමාධ්‍යයයි.
4) තාක්ෂණය අනුව නාලිකා විවිධාකාරයන්ගෙන් පරිවර්තනය වී ඇත.
5) දැකීම හා ඇසීම යනු ප්‍රභල නාලිකා ආකාර දෙකකි.

12) බාධක / ඝෝෂා පිළිබඳ සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

1) සාර්ථක සන්නිවේදනය අසාර්ථක කරයි.
2) බාධක ප්‍රධාන ආකාර පහකින් බලපායි.
3) බොහෝවිට සන්නිවේදනයට බාධක ඍණාත්මකව බලපායි.
4) අර්ථ බාධක බලපානුයේ භාෂාමය තත්ත්ව තුලිනි.
5) සංස්කෘතිකමය තත්ත්ව තුළින් පැනනගින බාධක ද ඇත.

13) තමා සමග සිදුකරනු ලබන සන්නිවේදනය පිළිබඳව ප්‍රකාශ කිහිපයක් පහත පරිදි වේ.

A. පංච ඉන්ද්‍රීන් යොදාගනී.
B. ස්ව සංකල්පය ගොඩනැගීමට උපකාරී වේ.
C. පුද්ගල ස්මෘතිය එතරම් වැදගත් නැත.
D. පුද්ගල චර්යා හෝ ඉරියව් අදාළ නොවේ.
E. සංජානනය මෙහි මූලිකාංගයක් වේ.

ඉහත ප්‍රකාශ අතුරින් සාවද්‍ය ප්‍රකාශ අන්තර්ගත අක්ෂර සහිත පිළිතුර තෝරන්න.

1) A හා C ය. 2) A හා B ය. 3) C හා D ය. 4) A හා D ය. 5) D හා E ය.

14) සමූහ සන්නිවේදනයේ දී එය සාර්ථකව කරගත හැක්කේ ඊට අදාළ විධි ක්‍රම කීපයක් අනුවය. එම විධි ක්‍රම සම්බන්ධයෙන් නිරවද්‍ය නොවන විධි ක්‍රමය ඇතුළත් පිළිතුර වනුයේ,

1) පෙර සූදානම
2) ප්‍රදීපාගාර උපක්‍රමය
3) සන්නිවේදක කේන්ද්‍රීය සන්නිවේදනය
4) අරමුණු සහගත බව
5) ආචාරශීලීභාවය

15) යමක් ප්‍රභලව ඉදිරිපත් කිරීමට සන්නිවේදකයකුට තිබිය යුතු වාචික සන්නිවේදන කුසලතාවක් නොවන්නේ,

1) වාග්කෝෂය පුළුල් කර ගැනීම.
2) පෙර සූදානම
3) යෝග්‍ය අනන්‍යතාවයක් ගොඩනගා ගැනීම.
4) පොදු අනන්‍යතාවයක් ගොඩනගා ගැනීම.
5) වචන වගකීමෙන් භාවිතය

16) 'HUB' ආකෘතියට අනුව නියාමකයෝ පිළිබඳ ප්‍රකාශ කීපයක් පහත පරිදි වේ.

A. ඍජුවම මාධ්‍ය ආයතනය හා සම්බන්ධ වේ.
B. මාධ්‍ය කටයුතු හා සම්බන්ද වී ඒවා පාලනය කරයි.
C. විවිධ රෙගුලාසි පැනවීමෙන් සන්දේශ පාලනය කරයි.
D. නියාමකයින් යනු තනි පුද්ගලයින් වේ.
E) දැන්වීම් ආයතන හා බහුජාතික සමාගම් ද ඇතැම්විට නියමකයින් වේ.

1) A හා D ය.
2) B හා C ය.
3) B, C හා D ය.
4) B, C හා E ය.
5) A, B හා E ය.

17) ක්‍රියාකාරකමක් වශයෙන් හෝ වෘත්තියක් වශයෙන් යම් රංගනයක යෙදීම රූපණය නොහොත් ප්‍රාසාංගිකතාව ලෙස හැඳින්වේ. රූපණය හා සම්බන්ධ පහත ප්‍රකාශවලින් සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

1) ආචාරශීලීව කතාබහ කිරීමට රූපණය එතරම් වැදගත් නැත.
2) උපකරණ, හැඩගැන්වීම්, ඇඳුම් වැනි දේ තුළින් රූපණය ප්‍රබල වේ.
3) රූපණ කුසලතා වර්ධනයට හේතුවන කරුණු කීපයක් පවතී.
4) ගැළපෙන අයුරින් භාවිතය තුළින් වඩාත් ඵලදායී සන්නිවේදනයක් සිදු කළ හැකිය.
5) රංගනයේ යෙදීමෙන් යම් යම් අර්ථ සන්නිවේදනය කළ හැකිය.

18) Informal communication (අවධිමත් සන්නිවේදනය) හා සම්බන්ධ පිළිගත නොහැකි ප්‍රකාශය තෝරන්න.

1) මූලාශ්‍රය පැහැදිලිව හඳුනාගත හැකිය.
2) කිසිදු නිල ස්වභාවයක් නොමැත.
3) වේගයෙන් පැතිරෙන ස්වභාවයක් ගනී.
4) නූතන සන්නිවේදන තාක්ෂණය ඔස්සේ වඩාත් ප්‍රබලව සිදුකළ හැකිය.
5) මානව හැඟීම්, ආකල්ප, විරෝධතා ප්‍රකාශනයට යොදාගනී.

19) A) රූපය මැනවින් දැකීම
B) රූප හඳුනා ගැනීම.
C) අධ්‍යාපනික කාර්යය සඳහා රූප භාවිතයට ගැනීම.

ඉහත කරුණු අදාළ වන්නේ,

1) දෘශ්‍ය සන්නිවේදනයේ ප්‍රාථමික යුගයට ය.
2) දෘශ්‍ය සන්නිවේදනයේ අද්‍යතන යුගයට ය.
3) දෘශ්‍ය සන්නිවේදනයේ කුසලතා වර්ධනයට ය.
4) දෘශ්‍ය සන්නිවේදනය අධ්‍යයනයට ය.
5) දෘශ්‍ය සන්නිවේදන මූලිකාංග වලට ය.

20) කිසියම් සන්නිවේදන ආකෘතියක් පිළිබඳ අදහස් කීපයක් පහත පරිදි වේ.

a) මෙය රේඛීය සන්නිවේදන ආකෘතියකි.
B) සන්නිවේදන ක්‍රියාවලියේ බලපෑම පිළිබඳ වැඩි අවධානයක් යොමු කරයි.
C) ප්‍රතිපෝෂණය හා බාධක පිළිබඳ සඳහන් නොවේ.

ඉහත අදහස්වලට වඩාත් සමීප සන්නිවේදන ආකෘතිය විය හැක්කේ,

1) ඔස්ගුඩ් ශ්‍රාම් ආකෘතිය යි.
2) ෂැනන් හා විවර් ආකෘතිය යි.
3) ඇරිස්ටෝටල් ආකෘතිය යි.
4) හැරල්ඩ් ඩී ලැස්වෙල් ආකෘතිය යි.
5) ජෝර්ජ් ගාබ්නර් ආකෘතිය යි.

21) අප්‍රත්‍යාස සන්නිවේදනය හා සම්බන්ධ සදොස් ප්‍රකාශය වන්නේ,

1) එය අන්තර්ජාල තාක්ෂණය හා සම්බන්ධ වේ. 2) එය ආරක්ෂිත ක්‍රියාවලියකි.
3) අඩු පිරිවැයකින් යුක්ත වේ. 4) භෞතික ඉඩකඩ විශාල වශයෙන් අවශ්‍ය වේ.
5) එක්වර විශාල පිරිසක් සමඟ සන්නිවේදනය කළ හැකිය.

22) පුද්ගලයෙකුගේ සිත තුළ හට ගන්නා අදහස්, සිතුවිලි ආදිය සංකේත ඇසුරෙන් පණිවිඩ බවට පත් කිරීමෙන් පසු එය ග්‍රහණය කරගැනීම.

1) ආකේතිකරණය යි. 2) විකේතිකරණය යි. 3) ආත්මභාෂණය යි.
4) කේතකරණය යි. 5) ස්වයං සංකල්පය යි.

23) A - විදග්ධ වචන නොගැළපීම.
B - රූපයට ප්‍රමුඛත්වය දීම.
C - කරුණු ඉක්මණින් මතකයෙන් ඉවත්ව යා හැකිවීම.
D - සාක්ෂරතාවයක් අවශ්‍යවීම.

මෙම කරුණු ගැළපෙන ජනමාධ්‍ය වන්නේ පිළිවෙලින්,

1) පුවත්පත, රූපවාහිනිය, පුවත්පත, පුවත්පත 2) ගුවන් විදුලිය, රූපවාහිනිය, පුවත්පත, පුවත්පත
3) ගුවන් විදුලිය, පුවත්පත, රූපවාහිනිය, රූපවාහිනිය 4) ගුවන් විදුලිය, රූපවාහිනිය, ගුවන් විදුලිය, පුවත්පත
5) පුවත්පත, රූපවාහිනිය, පුවත්පත, රූපවාහිනිය

24) වර්තමානයේ ජනමාධ්‍ය සන්දේශ විවිධ අයුරින් වාරණයට ලක්වේ. වාරණ විධි අතරට අයත් නොවන්නේ,

1) බලපෑම් කිරීම 2) දඬුවම් කිරීම 3) ආචාර ධර්ම ක්‍රියාත්මක කිරීම.
4) පාලනය කිරීම. 5) නීතිරීති

25) අර්ථ බාධකවලට වඩාත් හේතු විය හැක්කේ,

1) ග්‍රාහක දුබලතා 2) පණිවිඩ සම්ප්‍රේෂණ දුර්වලතා 3) තාක්ෂණික විෂමතා
4) නාලිකාව තීරණය කිරීමේ දුර්වලතා 5) සංකේත තෝරා ගැනීමේ දුර්වලතා

26) ''සංස්කෘතිය හෝ සභ්‍යත්වය යනු දැනුම, ඇදහිලි, කලා, නිති, සදාචාරය, සිරිත් විරිත්......'' ආදී ලෙස සංස්කෘතිය පිළිබඳව නිර්වචනයක් ඉදිරිපත් කරන ලද විද්වතා වන්නේ,

1) බී. මැලිනොව්ස්කි ය. 2) පර්සියස් කැටෝ ය. 3) හැරල්ඩ් ඩී. ලැස්වෙල් ය.
4) ග්‍රැහැම්බෙල් ය. 5) ඊ.බී. ටයිලර් ය.

27) සංස්කෘතිය හා සම්බන්ධ සාවද්‍ය ප්‍රකාශය වන්නේ,

1) සමාජය එකට බැඳ තබන පොදු වටිනාකම් සහිත වූවකි. 2) සමාජ ක්‍රියාකාරකම් වලින් සමන්විත වූවකි.
3) විශ්වාසයන්ගෙන් සමන්විත වූවකි. 4) එහි විවිධ සංකල්පනා අන්තර්ගත ය.
5) එය සරල ක්‍රියාවලියකි.

28) ප්‍රතිවීනවාදී ඉගැන්වීම්වලට අනුව සංස්කෘතිය යන වචනය ප්‍රථම වරට සංකල්පයක් ලෙද භාවිතයට පැමිණෙන්නේ,

1) 19 වන සියවසේ දී ය. 2) 17 වන සියවසේ දී ය. 3) 20 වන සියවසේ දී ය.
4) 21 වන සියවසේ දි ය. 5) 15 වන සියවසේ දි ය.

29) මාධ්‍ය සංස්කෘතිය පිළිබඳ වැරදි ප්‍රකාශය තෝරන්න.

1) මෙය කාලීන සංස්කෘතියේ විශේෂ අංගයකි.
2) මානව සමාජ පරිණාමයේ තොරතුරු අවධියට අයත් වූවකි.
3) මෙය 21 වන සියවසේ මුල් යුගය තුළ සමාජ ගත වූවකි.
4) මෙහි බහුවිධ ස්වරූප හා බහුවිධ ශෛලීන් අන්තර්ගත ය.
5) සමකාලීන පුද්ගල හැකියාව පිළිබඳ සංස්කෘතිය වූ කලී මාධ්‍ය සංස්කෘතිය යි.

30) අන්තර් සංස්කෘතික අධ්‍යයනය පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත වේ.

A. පුද්ගලයා අවට ලෝකයට අනුවර්තනය කරගන්නා ප්‍රධාන ම උපකරණය අන්තර් සංස්කෘතික අධ්‍යයනය යි.

B. ලොව පුරා පවතින විවිධ සංස්කෘති පිළිබඳ අධ්‍යයනය කිරීමේ කලාවකි.

C. සන්නිවේදන විෂය ක්ෂේත්‍රයේ දී එය විවිධ සංස්කෘතික තුලනය කිරීම ලෙසද හඳුන්වයි.

D. සන්නිවේදන තාක්ෂණයේ ශීඝ්‍ර දියුණුවත් සමග විවිධ රටවල ජාතික සංස්කෘති ඒ රටවලට අනන්‍ය කොට ඇත.

E. සංස්කෘතිය පිළිබඳ අධ්‍යයනය කිරීම එදා මෙදා තුර මානව හා සමාජ විද්‍යා විෂයයන්ගේ කාර්යභාරයකි.

ඉහත ප්‍රකාශ අතුරින් සාවද්‍ය ප්‍රකාශ අන්තර්ගත පිළිතුර වනුයේ,

1) A හා C ය. 2) B හා D ය. 3) A හා E ය. 4) B හා C ය. 5) D හා E ය.

31) සන්දේශයක් පිළිබඳ ප්‍රකාශ කීපයක් පහත පරිදි වේ.

A. සන්නිවේදකයකු තවත් පර්ශවයන් සමග හුවමාරු කර ගන්නා යමකි.

B. සන්දේශය අදහසක්, මතයක්, ආකල්පයක් විය හැකිය.

C. සන්දේශයක් සෑම විට ම වචන ආශ්‍රයෙන් ගොඩනැගේ.

D. සමාජ, සංස්කෘතික සාධක මත සන්දේශයේ අර්ථය වෙනස් නොවේ.

ඉහත ප්‍රකාශ අතුරින් සාවද්‍ය ප්‍රකාශ අන්තර්ගත පිළිතුර ලෙස ඔබ සිතන්නේ,

1) A හා C ය. 2) A හා D ය. 3) C හා D ය. 4) B හා C ය. 5) B හා D ය.

32) මාධ්‍ය විස්තාරණය (Media Implication) පිළිබඳ සාවද්‍ය නොවන ප්‍රකාශය තෝරන්න.

1) යම් කරුණකට වැඩි අවධාරිත බලයක් දීමේ ක්‍රියාවලිය යි.
2) කරුණු රාශියක් ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලිය යි.
3) ආයතනික මට්ටමක සිට සිදුවන ක්‍රියාවලියක් බවයි.
4) ආර්ථික ලාභ අපේක්ෂාවෙන් සිදුවන්නක් බවයි.
5) ඉහත සියල්ලම පිළිගත නොහැක.

33) ජන සන්නිවේදනයේ කාර්යයක් නොවන්නේ,

1) ප්‍රජානනය 2) අපසරණය 3) සමාජ උපයෝගීතාව 4) නියාමනය 5) නිශ්කර්ෂණය

34) විධිමත් සන්නිවේදනය පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත පරිදි වේ.

a. මූලාශ්‍රය පැහැදිලි වූවකි.
b. නිල ස්වභාවයක් පවතී.
c. නිශ්චිත ධූරාවලීගත ක්‍රියාවලියකි.
d. වඩාත් ප්‍රතිඵලදායී ක්‍රියාවලියකි.
e. ක්‍රමවත් පියවර ගණනාවක ප්‍රතිඵලයකි.

ඉහත ප්‍රකාශ අතුරින් පිළිගත හැකි ප්‍රකාශ අන්තර්ගත පිළිතුර වනුයේ,

1) a හා b ය. 2) b හා c ය. 3) c හා d ය. 4) d හා e ය. 5) a, b, c, d හා e සියල්ලම ය.

35) ''ජන කවි'' සම්බන්ධයෙන් ප්‍රකාශ කිහිපයක් පහත පරිදි වේ.

a. මුඛ පරම්පරාගතව පැවත එයි.
b. සරල බස් වහරක් භාවිතා වේ.
c. නිර්මාණකරුවන් පැහැදිලිය.
d. පොදු ලක්ෂණ සහිත වූවකි.
e. ජීවන අත්දැකීම් පාදක වූවකි.

ඉහත ප්‍රකාශ අතුරින් සාවද්‍ය ප්‍රකාශ අන්තර්ගත පිළිතුර වනුයේ,

1) a, b හා c ය. 2) b, c හා d ය. 3) a, b හා d ය. 4) a, c හා e ය. 5) a, b හා e ය.

36) සාම්ප්‍රදායික මාධ්‍යයේ වැදගත්කමක් නොවන්නේ,

1) දැනුම ඉගෙනුම් සම්පාදනය යි.
2) පුද්ගල චරිත සෑම විටම විවේචනය යි.
3) විනෝදාස්වාදය යි.
4) භාව ප්‍රකාශනය යි.
5) සංස්කෘතික අංග හුවමාරුවයි.

37) සිනමා මාධ්‍යයේ මූලික ලක්ෂණයක් ලෙස ගත නොහැක්කේ,

1) සංකීර්ණ තාක්ෂණයක් සහිත වීමයි.
2) ආකර්ෂණීය මාධ්‍යයක් වීමයි.
3) ශ්‍රව්‍ය දෘශ්‍ය වීමයි.
4) පොදු මාධ්‍යයක් වීමයි.
5) පූර්ණ අවධානය දිනාගන්නා මාධ්‍යයක් වීමයි.

38) සාම්ප්‍රදායික සංස්කෘතිය හා සම්බන්ධ සාවද්‍ය ප්‍රකාශය වන්නේ,

1) උත්තරීතර, පූජනීය දෙයකි.
2) මානවයාගේ දීර්ඝතම කාලයක් තුළ පැවතියකි.
3) ජනයාගේම උරුමයකි.
4) සාම්ප්‍රදායික, සංස්කෘතිය පෝෂණය නොවන්නකි.
5) කාර්මික සමාජ මත සාම්ප්‍රදායික සමාජ සංස්කෘතිය නූතන සමාජ සංස්කෘති බවට පත් විය.

39) ගෝලීය සංස්කෘතිය පිළිබඳ සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

1) වර්තමාන මිනිසාගේ ජීවිතයේ සියලු ක්ෂේත්‍ර ගෝලීය සංස්කෘතිය මගින් ස්පර්ශ කරයි.
2) ගෝලීයකරණය යන සංකල්පය මුලින්ම ජෝන් මැක්ලීන් භාවිතා කර ඇත.
3) ගෝලීය සංස්කෘතිය නමැති අදහස රොබර්ට්සන් විසින් හඳුන්වා දෙන ලදි.
4) ජාතික රාජ්‍යයන් සමග ඇති විවිධ සබඳතා මේ ඔස්සේ තව දුරටත් ශක්තිමත් වේ.
5) මෙය ලොව පුරා සියලු ජාතික, වාර්ගික සංස්කෘතීන් විනාශ කරමින් ව්‍යාප්ත වන ජන සංස්කෘතියකි.

40) සංස්කෘතිය කෙරෙහි ජනමාධ්‍යයේ බලපෑම පිළිබඳව පහත ප්‍රකාශ අතුරින් පිළිගත නොහැකි ප්‍රකාශය තෝරන්න.

1) සංස්කෘතිය, මාධ්‍ය, සන්නිවේදනය යනු එකිනෙකට වෙන් කළ නොහැකි ප්‍රපංච තුනකි.
2) වර්තමාන ජනමාධ්‍ය විසින් සමාජ මානසිකත්ව පැතිකඩට විශාල බලපෑමක් ඇති කරයි.
3) වර්තමාන ජනමාධ්‍ය මානව සංස්කෘතිය කෙරෙහි සෑම විටම සෘණාත්මක බලපෑම් ඇති කරයි.
4) මාධ්‍යයෙහි සංස්කෘතික බලපෑම පුද්ගල ආකල්ප, හැසිරීම් ආදියට බලපා ඇත.
5) සාම්ප්‍රදායික මාධ්‍යයේ බලපෑමට වඩා ජනමාධ්‍යයේ බලපෑම වෙනස් වේ.

41) මාධ්‍ය සාක්ෂරතාව පිළිබඳ ප්‍රකාශ කීපයක් පහත පරිදි වේ.

a. මාධ්‍ය සාක්ෂරතාව තෙවැදෑරුම් ය.
b. මාධ්‍ය මගින් ඉදිරිපත් වන විවිධ සන්දේශ වටහා ගැනීම හා භාවිතා කිරීමට ඇති හැකියාව මාධ්‍ය සාක්ෂරතාවය යි.
c. මාධ්‍ය සාක්ෂරතාව සාම්ප්‍රදායික සමාජ තුළින් පැන නගින ලද්දකි.
d. මාධ්‍ය තුළ ක්‍රියාශීලීව කටයුතු කිරීමේ හැකියාව මීට අයත් වූවකි.
e. මුද්‍රිත මාධ්‍ය තුළ මෙය බහුලව භාවිතා වන සංකල්පයකි.

ඉහත ප්‍රකාශ අතුරින් පිළිගත හැකි ප්‍රකාශ අන්තර්ගත පිළිතුර ලෙස සිතිය හැක්කේ,

1) a, b හා c ය. 2) b, c හා d ය. 3) a, d හා e ය. 4) a, b හා e ය. 5) a, b හා d ය.

42) ඥාන ව්‍යූහය හා සම්බන්ධ සාවද්‍ය පිළිතුර තෝරන්න.

1) ඥාන ව්‍යූහයන් මත මාධ්‍ය මගින් ගලා එන නව තොරතුරු තේරුම්ගත හැකිය.
2) යමෙකුගේ ඥාන ව්‍යූහ පුළුල්වන තරමට ඔහුට මාධ්‍ය සාක්ෂරතාවයේ නිපුණත්වයක් ලැබේ.
3) තොරතුරු සෑදී ඇත්තේ කරුණු මගිනි.
4) පුද්ගල මනස තුළ තැම්පත් වී ඇති සැකසුණු තොරතුරු කට්ටලයකි.
5) ඥාන ව්‍යූහයන් පුද්ගලයා තුළ ස්වයං සිද්ධව ජනනය වන්නකි.

43) උසස් මාධ්‍ය සාක්ෂරතාවක් තුළින් ලැබෙන ප්‍රයෝජන පිළිබඳ කරුණු ඉදිරිපත් කරන ලද විද්වතා වූයේ,

1) W. ජේම්ස් පොටර් ය. 2) එඩ්වර්ඩ් ටී. හෝල් ය. 3) ජෝර්ජ් එල්. ට්‍රේගර් ය.
4) ජෝන් මැක්ලීන් ය. 5) රොබර්ට්සන් ය.

44) නිර්මාණශීලී කියැවීම යනු,

1) නිර්මාණකරුගේ කාර්යයකි. 2) ග්‍රාහකයන්ගේ කාර්යයකි.
3) විචාරකයන්ගේ කාර්යයකි. 4) මාධ්‍යකරුවන්ගේ කාර්යයකි.
5) පාඨකයන්ගේ කාර්යයකි.

45) බොහෝ මාධ්‍ය ආයතන ග්‍රාහකයන්ට මුදල් සහ බඩු මුට්ටු ලබාදෙමින් තම ග්‍රාහක වපසරිය පුළුල් කර ගැනීමට තරග වදින්නේ,

1) වසරේ ජනප්‍රියම මාධ්‍ය ආයතන ලෙස කිරුළු පැළඳීමට ය.
2) නව මාධ්‍ය සංදේශ පුළුල් ලෙස සමාජ ගත කිරීමට ය.
3) සමාජ සුබසාධනය තුළින් කීර්තිය වර්ධනය කර ගැනීමට ය.
4) තමන් වෙත ගලා එන අනුග්‍රාහකත්වය ඉහළ දමා ගැනීමට ය.
5) තමන්ට වෙළඳ දැන්වීම් ලබාදෙන ආයතන සඳහා උපරිම සාධාරණය ඉටු කිරීමට ය.

46) මාධ්‍ය සාක්ෂරතාවය ග්‍රාහක සමාජයට බලපාන්නේ,

1) මාධ්‍ය සන්දේශ විචාරයට ලක් කිරීමට ය.
2) මාධ්‍ය භාවිතයෙන් ඉවත් වී සිටීමට ය.
3) අහිතකර මාධ්‍ය එරෙහි වීමට ය.
4) උචිත මාධ්‍ය සන්දේශ තෝරා බේරා ගැනීමට ය.
5) හිතකර මාධ්‍ය භාවිතයට ඉහළ ප්‍රතිපෝෂණයක් ලබාදීමට ය.

47) මාධ්‍ය සංදේශවල යටි අරුත හඳුනා ගැනීම.

1) අහම්බයකි.
2) නිර්මාණශීලී කියැවීමේ ඵලයකි.
3) ග්‍රාහකයා විසින් ආරෝපණය කරන්නකි.
4) මාධ්‍ය සාක්ෂරතාව විසින් මතුකර දක්වන්නකි.
5) සන්නිවේදකයාගේ සැඟවුණු න්‍යාය පත්‍රය හෙළිදරව් වීමකි.

48) ඓතිහාසික සිදුවීමක් පාදක කරගත් චිත්‍රපටයක් විචාරයට ලක් කිරීමට උනන්දු වන විචාරකයා වඩාත් අවධානයට ලක් කළ යුත්තේ,

1) අඳුර සහ ආලෝකය ගැලපීම පිළිබඳවය. 2) කලා අධ්‍යක්ෂණය හා අංග රචනය පිළිබඳවය.
3) කැමරා කෝණය සහ රූප රාමු පිළිබඳවය. 4) පර්යාවලෝකනය පිළිබඳවය.
5) සංස්කරණ ශෛලිය පිළිබඳවය.

49) බහුජාතික සමාගම් විසින් සැලසුම් සහගතව ප්‍රවර්ධනය කරනු ලබන සංස්කෘතිය වන්නේ,

1) ජන සංස්කෘතිය යි. 2) බහුජන සංස්කෘතිය යි.
3) ජනප්‍රිය සංස්කෘතිය යි. 4) වෙළඳ සංස්කෘතිය යි.
5) මාධ්‍ය සංස්කෘතිය යි.

50) ශ්‍රාම් - ඔස්ගුඩ් සන්නිවේදන ආකෘතිය පිළිබඳ සාවද්‍ය පිළිතුර තෝරන්න.

1) රේඛීය නොවන ආකෘතියකි.
2) සන්නිවේදනයේ දී සන්නිවේදකයා මෙන්ම ග්‍රාහකයා ද වැදගත්වන බව පෙන්වීම.
3) ආකේතකරය, විකේතකරය, අර්ථකථනය පැහැදිලි කිරීම.
4) සන්නිවේදනය යනු, ආන්තික ක්‍රියාවලියක් බව පැහැදිලි කිරීම.
5) ප්‍රතිපෝෂණයක් පවතින බව දැක්වීම.

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය 12

# තුන්වන වාර පරීක්ෂණය - 2023

විෂයය :- සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - II

පාසලේ නම : ..............................................................................................

ඇතුළත්වීමේ අංකය : ................................

කාලය : පැය 03 යි

**උපදෙස් :**

- ❖ ප්‍රශ්න අංක 1 සිට 7 දක්වා ප්‍රශ්න අතරින් තෝරාගත් ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.
- ❖ එක් ප්‍රශ්නයකට ලකුණු 40 බැගින් හිමි වේ.

---

01) සන්නිවේදනය යනු මානවයාගේ සමාරම්භයේ සිට පැවතුණ ද එය විෂයක් ලෙස අධ්‍යයනය කිරීම ආරම්භ වන්නේ 20 වන සියවසේ මධ්‍ය භාගයෙන් පසුව ය.''

i) සන්නිවේදනය විෂයක් ලෙස ආයතන ගත කිරීමට දායක වූ විද්වතා කවුරුන් ද ?

ii) සන්නිවේදනය ශාස්ත්‍රීය විෂයක් ලෙස වර්ධනය කිරීමට මූලාරම්භය සැපයූ විද්වතුන් **සිව්දෙනෙකු** ලියා දක්වන්න.

iii) සන්නිවේදනය ශාස්ත්‍රීය විෂයක් ලෙස අධ්‍යයනයේ ඇති වැදගත්කම කරුණු **තුනකින්** විස්තර කරන්න.

iv) සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂය හැදෑරීමේ අවශ්‍යතාවය කරුණු **හතරක්** ඔස්සේ පැහැදිලි කරන්න.

02) ''සන්නිවේදනය යනු ක්‍රියා පටිපාටියකි.''

i) සන්නිවේදනය හා සම්බන්ධ **චාල්ස් කුලීගේ** නිර්වචනය ලියා දක්වන්න.

ii) සන්නිවේදනයේ මූලිකාංග හතරක් දක්වා ඉන් **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න.

iii) සන්නිවේදනයේ ස්වභාවය කරුණු **තුනක්** ඔස්සේ උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

iv) අතථ්‍ය සන්නිවේදනයේ ප්‍රයෝජන **හතරක්** විස්තර කරන්න.

03) සන්නිවේදන ක්‍රියාවලියේ දී සන්නිවේදකයා ග්‍රාහකයා වෙත සන්දේශ ලබාදීම සඳහා භාවිතා කරනු ලබන ක්‍රම ශිල්ප පදනම් කොට ගෙන සන්නිවේදන ස්වරූප ගොඩනංවා ඇත.

i) වාචික සන්නිවේදනය යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

ii) වාචික සන්නිවේදනයේ කාර්යයන් **හතරක්** නම් කරන්න.

iii) සන්නිවේදකයකුට යමක් ප්‍රභලව ඉදිරිපත් කිරීමට ඔහු සතුව පැවතිය යුතු වාචික සන්නිවේදන කුසලතා **හතරක්** නම් කර, ඉන් **දෙකක්** පැහැදිලි කරන්න.

iv) අවාචික සන්නිවේදනය **උදාහරණ** මගින් පැහැදිලි කරන්න.

04) i) සාම්ප්‍රදායික මාධ්‍ය යනු කුමක්දැයි අර්ථ කථනය කරන්න.

ii) ඔබ දන්නා සාම්ප්‍රදායික මාධ්‍ය **හතරක්** නම් කරන්න.

iii) සාම්ප්‍රදායික මාධ්‍ය සතු විශේෂතා **තුනක්** නම් කර, ඉන් **දෙකක්** පැහැදිලි කරන්න.

iv) සාම්ප්‍රදායික සන්නිවේදනයේ දී ජන කවිවලට සුවිශේෂී වටිනාකමක් හිමි වේ. **උදාහරණ දෙකක්** ඇසුරින් පහදන්න.

05) සාම්ප්‍රදායික සන්නිවේදන කලාව තුළ ජන කතා හා ගැමි නාටක සුවිශේෂ වේ.

i) ජන කතා යනු කුමක්දැයි **කෙටියෙන්** පහදන්න.

ii) සමාජය තුළ ජනකතා විවිධාකාරයේ වර්ග ඇත. එවැනි ජනකතා වර්ග **හතරක්** නම් කරන්න.

iii) ඔබ දන්නා ගැමි නාටක **තුනක්** නම් කර, ඉන් **දෙකක්** උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න.

iv) ජනමාධ්‍ය කාර්ය භාරය පිළිබඳ බටහිර විද්වතුන් **දෙදෙනෙකුගේ** මත සැකවින් පහදන්න.

06) මානව සංස්කෘතිය බිහි වූයේ සහ වර්ධනය වූයේ මානවයාගේ සම්බන්ධතා හේතු කොට ගෙනය. අන් සියලුම සත්ත්වයින්ගෙන් මිනිසා ගුණාත්මක ලෙස වෙනස්ව හඳුනා ගැනීමේ මූලික ලක්ෂණයකි සංස්කෘතිය.

i) ප්‍රාරම්භක අවධියේ සමාජානුයෝජන ක්‍රියාවලියට දායක වූ කාරකයන් **දෙකක්** නම් කරන්න.

ii) ජනප්‍රිය සංස්කෘතියේ විශේෂතා **හතරක්** නම් කර, ඉන් එක් විශේෂතාවයක් කෙටියෙන් පැහැදිලි කරන්න.

iii) මාධ්‍ය සාක්ෂරතාවයේ **තෙවැදෑරුම් සිද්ධාන්ත** පැහැදිලි කරන්න.

iv) වර්තමාන රූපවාහිනී මාධ්‍ය දැන්වීම් තුළින් සංස්කෘතිය කෙරෙහි ඇතිකරනු ලබන **සෘණාත්මක බලපෑම් හතරක්** සුදුසු උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න.

07) කිසියම් භාෂාවක් ලිවීමට හා කියවීමට ඇති හැකියාව සාක්ෂරතාව ලෙස සරලව හඳුන්වයි. සාක්ෂරතාව යන්න එසේ සරලව හැඳින්වූව ද වර්තමානය වන විට එය පුළුල් හා සංකීර්ණ තත්ත්වයකට පරිවර්තනය වී ඇත.

i) මාධ්‍ය සාක්ෂරතාව පිළිබඳව ''ජාතික මාධ්‍ය සාක්ෂරතාව සඳහා ජාතික ආයතනය'' විසින් ඉදිරිපත් කරනු ලබන අංශ **දෙකක්** නම් කරන්න.

ii) විචාරශීලී ග්‍රාහකයෙකු මාධ්‍ය හමුවේ ක්‍රියාත්මක වන ආකාර **දෙකක්** දක්වා ඉන් එක් ආකාරයක් කෙටියෙන් පැහැදිලි කරන්න.

iii) මාධ්‍ය විචාරයට අයත් දෘෂ්ටිවාද පැහැදිලි කරන්න.

iv) ඵලදායී මාධ්‍ය සන්දේශයක ගුණාංග වර්තමාන මාධ්‍ය අතරින් ඔබ **තෝරාගත් මාධ්‍යයක්** තුළ කොතෙක් දුරට නිරූපණය වන්නේ දැයි සැකවින් විස්තර කරන්න.

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
|---|
| 12 |

# තුන්වන වාර පරීක්ෂණය - 2023

විෂයය :- **සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය**

පාසලේ නම : ........................................................................................

ඇතුළත්වීමේ අංකය : ............................ කාලය :

## විසඳුම් පත්‍රය - I

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| **01** - 4 | **02** - 3 | **03** - 2 | **04** - 4 | **05** - 2 | **06** - 5 | **07** - 3 | **08** - 3 | **09** - 4 | **10** - 2 |
| **11** - 3 | **12** - 2 | **13** - 3 | **14** - 3 | **15** - 4 | **16** - 1 | **17** - 1 | **18** - 1 | **19** - 3 | **20** - 4 |
| **21** - 4 | **22** - 2 | **23** - 2 | **24** - 3 | **25** - 5 | **26** - 5 | **27** - 5 | **28** - 2 | **29** - 3 | **30** - 5 |
| **31** - 3 | **32** - 1 | **33** - 4 | **34** - 5 | **35** - 5 | **36** - 2 | **37** - 1 | **38** - 4 | **39** - 4 | **40** - 3 |
| **41** - 5 | **42** - 5 | **43** - 1 | **44** - 2 | **45** - 4 | **46** - 5 | **47** - 5 | **48** - 2 | **49** - 3 | **50** - 4 |

## විසඳුම් පත්‍රය - II

01) i) මහාචාර්ය විල්බර් ශ්‍රාම් (ල. 04)

ii) 1. මහාචාර්ය විල්බර් ශ්‍රාම් 2. හැරල්ඩ් ඩී ගැස්වෙල් 3. කර්ට් ලෙවින්
4. පෝල් ලැසොස්බෝල්ඩ් 5. කාල් හව්ලන්ඩ් 6. ජෝර්ජ් ගාබ්නර්
(ල. 2 × 4 = 8)

iii) 12 ශ්‍රේණිය ගුරු අත්පොත පිටු අංක 06 (ල. 4 × 3 = 12)

iv) 1. සන්නිවේදන කුසලතා වර්ධනය 2. මාධ්‍ය සාක්ෂරතාව
3. නිර්මාණශීලී සන්නිවේදන කුසලතා 4. විචාරශීලී මාධ්‍ය පරිහරණය
(12 ශ්‍රේණිය ගුරු අත්පොත පිටු : 12) (ල. 4 × 4 = 16)

02) i) ''මානව සම්බන්ධතා රඳවා සිටින්නවුත්, වර්ධය කරන්නාවූත් සියලු සංකේත මෙන්ම ඒවා දේශයෙන් දේශයට ප්‍රවාහනය කිරීමටත්, කාලයේ බැඳුම් වලින් ඔබ්බට ගොස් සුරක්ෂිත කර ගැනීමටත් උපකාරී වන උපක්‍රමය සන්නිවේදනය යි.

(ල. 04)

ii) 1. සන්නිවේදකයා 2. අකේතකරණය 3. සංදේශය 4. මාධ්‍යය 5. ග්‍රාහකයා
6. විකේතකරණය 7. ප්‍රතිපෝෂණය 8. ඝෝෂා 9. අත්දැකීම් පසුතලය
10. සන්දර්භය 11. බලපෑම
(ල : නම් කිරීමට 1 × 4 = 04)
(විස්තර කිරීමට -2 × 2 = 04
= 08)

iii) 1. අරමුණු සහගත බව 2. සංකේතාත්මක බව 3. සන්දර්භානුගත බව
4. ක්‍රියා පටිපාටියක් බව 5. විවිධාකාර බව 6. ඒක මාර්ගික හෝ ද්වි මාර්ගික බව
7. බලයක් බව
(ල : පැහැදිලි කිරීමට 3 × 2 = 06)
(උදාහරණ දැක්වීමට -3 × 2 = 06
= 12)

iv) 1. අධ්‍යාපන කාර්ය සඳහා
2. සම්බන්ධතා ගොඩනැගීම සඳහා
3. ව්‍යාපාරික කටයුතු සාර්ථකව හා කාර්යක්ෂමව සිදු කර ගැනීම සඳහා
4. ප්‍රචාරණ කටයුත සඳහා
5. නිර්මාණාත්මක කාර්ය සඳහා චින්තනය පුබුදුවාලීම සඳහා (ල. 4 × 4 = 16)

03) i) යම් භාෂාවක වචන, ශබ්ද රටා භාවිතා කරමින් සිදු කරනු ලබන සන්නිවේදන ආකාරය වාචික සන්නිවේදනය නම් වේ. (ල. 04)

ii)
1. ඉගැන්වීම, උපදෙස් දීම, මඟපෙන්වීම
2. තොරතුරු හුවමාරුව
3. මානව සබඳතා පවත්වා ගැනීම
4. භාවයන් ප්‍රකාශයට පත් කිරීම
5. විවිධ කාර්යයන් ඉටුකර ගැනීම
6. පුද්ගල පෞර්ෂ්‍ය ඇති කිරීම

(ල. 2 × 4 = 08)

iii)
1. වාග් කෝෂය පුළුල් කර ගැනීම.
2. පෙර සූදානම.
3. දැනුම වර්ධනය කර ගැනීම.
4. ඉදිරිපත් කිරීමේ කුසලතා වර්ධනය කර ගැනීම.
5. යෝග්‍ය භාෂා භාවිතය.
6. ස්වීයත්වයක් ගොඩනඟා ගැනීම.
7. වගකීමෙන් යුතුව වචන භාවිතය

(ල. නම් කිරීම - 1.5 × 4 = 06)
(විස්තර කිරීමට - 3 × 2 = 06
= 12)

iv)
1. ලිඛිත හෝ වචන භාවිතයෙන් තොරව සිදුවීම.
2. ශරීර භාෂාව ප්‍රභලව භාවිතය.
3. අවාචික සන්නිවේදනයේ අර්ථයන් රටකින් රටකට, ජන වර්ගයකින් වර්ගයකට වෙනස්වන බව.
4. සංඥා හා සංකේත භාවිතයෙන් සිදුවීම.
5. ලොව පුරා පොදු සංඥා හා සංකේත පැවතීම.

(ල. උදාහරණ සහිතව පැහැදිලි කර තිබේනම් සම්පූර්ණ ලකුණු 16)

04) i) කාලාන්තරයක් තිස්සේ ගැමි ප්‍රජාව අතර තොරතුරු, දැනුම, විවේකය, විනෝදය සඳහා භාවිතා වන අවට පරිසරයෙන් පහසුවෙන් සපයා ගත හැකි සම්පත් උපයෝගී කරගෙන සිදුකරන සන්නිවේදනය ක්‍රම සාම්ප්‍රදායික මාධ්‍ය වේ. (ල. 04)

ii)
1. ජන කවි
2. ජන කතා
3. ශාන්තිකර්ම හා යාතු කර්ම
4. ගැමි නාටක
5. ජන ක්‍රීඩා
6. ජන ආගම්
7. ජන වෙදකම
8. ඇදහිලි විශ්වාස

(ල. 2 × 4 = 08)

iii)
1. සරල ව්‍යුහය
2. තේමාත්මක අන්තර්ගතය
3. නම්‍යශීලීත්වය
4. සංස්කෘතික සන්දර්භය
5. අවම පිරිවැය
6. පරිසර හිතකාමී බව
7. කතෘ අවිනිශ්චිත වීම

(ල. නම් කිරීමට - 2 × 3 = 06)
(විස්තර කිරීමට - 3 × 2 = 06
= 12)

iv) (12 ශ්‍රේණිය ගුරු අත් පොත පිටු අංක 54)

(ල. උදාහරණ සහිතව පැහැදිලි කර තිබේ නම් සම්පූර්ණ ලකුණු 16)

05) i) ජන කතා යනු මුල, මැද, අග ඉතා මනාව ගැලපීම මඟින් නිර්මාණය කරනු ලබන්නකි. ඒ අනුව ජනයාගේ ජීවන අරගලය, අපේක්ෂා, ආශා, දුක්ඛ, දොම්නස්සයන්, ගවේෂණ ආදිය පිළිබිඹු කරන කතාන්දර විශේෂයකි.

(ල. 04)

ii)
1. උත්පත්ති කතා
2. සත්ත්ව කතා
3. දේව කතා
4. වෘක්ෂලතා කතා
5. ආශ්චර්ය කතා
6. අත්භූත කතා
7. හාස්‍යොත්පාදන කතා
8. උපහාස කතා

(ල. 2 × 4 = 08)

iii)
1. සොකරි
2. කෝලම්
3. රූකඩ මින් දෙකක් උදාහරණ සහිතව පැහැදිලි කර තිබිය යුතුය.

(ල. නම් කිරීමට - 2 × 3 = 06)
(උදාහරණ සහිතව විස්තර කිරීමට - 3 × 2 = 06
= 12)

iv)
1. හැරල්ඩ් ඩී ලැස්වෙල් -
   1. සුපරීක්ෂණය
   2. ප්‍රවෘත්ති ලොව පුරා බෙදාහැරීම.

3. ග්‍රාහක මතය හා අදහස් හැඩගැස්වීම.

2. මහාචාර්ය විල්බර් ශ්‍රාම්
   1. ආරක්ෂකයෙකුගේ භූමිකාව
   2. සාකච්ඡා මණ්ඩපයක භූමිකාව
   3. ගුරුවරයෙකුගේ භූමිකාව

(උදාහරණ සහිතව විස්තර කිරීමට - 8 × 2 = 16)

06) i) පවුල, ළදරු පාසල, වැඩිහිටියන්, ආගමික මධ්‍යස්ථාන (ල. 2 × 2 = 04)

ii) නොගැඹුරු වීම, සරල වීම, මහා පරිමාණිකව නිෂ්පාදනය වීම, සියලුම දෙනාට සමීප වීම, අතිරික්තයක් සහිත වීම.

(ල. නම් කිරීමට - 1 × 4 = 04)
(විස්තර කිරීමට - 4 × 1 = 04
= 08)

iii) 1. ස්ව - කේන්ද්‍රය 2. ඥාන ව්‍යුහය 3. කුසලතා
(12 ශ්‍රේණිය ගුරු අත්පොත පිටු අංක 88 - 95)

(ල - 4 × 3 = 12)
(නම් කිරීමට ලකුණු නැත)

iv) සිසු පිළිතුරු

(ල. පැහැදිලි කිරීමට - 4 × 3 = 12)
(උදාහරණ සඳහා - 1 × 4 = 04
= 16)

07) i) 1. මාධ්‍යයන්ට ප්‍රවේශ වීම. 2. මාධ්‍ය විශ්ලේෂණය. 3. මාධ්‍ය ඇගයීම. 4. මාධ්‍ය නිර්මාණය
5. මාධ්‍ය තුළ ක්‍රියාශීලීව කටයුතු කිරීම.

(ල. - 2 × 2 = 04)

ii) 1. තොරතුරු ලබාගන්නේ කෙසේ ද ? 2. කාගෙන් ද ?
3. කොහෙන්ද ? 4. මාධ්‍ය සන්දේශ පිළිබඳ ප්‍රශ්න කරයි.

(ල. නම් කිරීමට - 2 × 2 = 04)
(ල. පැහැදිලි කිරීමට - 2 × 2 = 04
= 08)

iii) 1. මාක්ස්වාදී විචාරය
2. මනෝවිශ්ලේෂණ විචාරය
3. ස්ත්‍රීවාදී විචාරය (12 ශ්‍රේණිය ගුරු අත්පොත පිටු : 101, 102)

(ල. නම් කිරීමට ලකුණු නැත)
(ල. පැහැදිලි කිරීමට - 3 × 4 = 12)

iv) 1. සරල බව 2. විශේෂත්වය 3. ව්‍යුහය 4. ඇලීම
(12 ශ්‍රේණිය ගුරු අත්පොත පිටු : 115, 116)

(ල. -4 × 4 = 16)


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න